ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය 2013 නොවැම්බර් 22

## මුදල් සමාගම් සහ බැංකු ශක්තිමත් කිරීම

බලපත්‍රලාභී මුදල් සමාගම් ශක්තිමත් කිරීමේ අරමුණින් මූල්‍ය අංශය තුළ ඒකාබද්ධ වීම් දිරිගැන්වීම සඳහා මහ බැංකුව කටයුතු සිදු කරමින් සිටින අතර එය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බදු සහන ලබා දීමේ යෝජනාවක්ද 2014 අයවැය මගින් යෝජනා කර ඇත. ගරු මුදල් අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද එකී යෝජනාවට අනුකූලව මුදල් සමාගම් ඒකාබද්ධ කිරීම කඩිනම් කිරීම සඳහා අදාල මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2014 ජනවාරි 2 වන දින ප්‍රකාශයට පත් කිරීමට නියමිත 2014 සහ ඉන් ඉදිරිය සඳහා මහ බැංකු ඉදිරි දැක්ම මගින් නිකුත් කරනු ඇත.

මෙම නව ක්‍රියාමාර්ග 2009 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන ද්‍රවශීලතා අර්බුදවලට මුහුණ දෙමින් සිටින මුදල් සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත්ව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියන්ට වැඩිමනත්ව ක්‍රියාත්මක වනු ඇත. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් තුළ දැනට කළමනාකරණ නියෝජිතයන් පත් කිරීම, ශේෂ පත්‍රයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ නව ආයෝජකයන් විසින් ප්‍රාග්ධනය ආයෝජනය කිරීම අන්තර්ගත වේ. මෙයට අමතරව 2013 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන්පතු රක්ෂණ අරමුදලෙන් ද්‍රවශීලතා ආධාරක වැඩසටහනක්ද හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ද්‍රවශීලතා අර්බුදවලට මුහුණ දෙන්නා වූ මුදල් සමාගම් වර්තමානයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන අතර නව ක්‍රියාමාර්ග තුළින් එම සමාගම් තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.